*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අනාවරණ පරීක්ෂණය 2021

**8 ශ්‍රේණිය** **භූගෝල විද්‍යාව** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

සැලකිය යුතුයි

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.**

01 ආලෝකය හා තාපය නිකුත් කරන සූර්යයා ද ........................................ කි.

(ග්‍රහලෝකය / තාරකාව / වාමන ග්‍රහලෝකය)

02 මුළු පෘථිවි තලයෙන් ........................................ ක් ජලයෙන් වැසී පවතී. (71 % / 97 % / 29 %)

03 වෙරළ භූ දර්ශනය තුළ දැකිය හැකි ........................................ ජෛව විවිධත්වය අධික පරිසර පද්ධතියකි. (කලපු / බොකු / කඩොලාන)

04 ග්‍රාමීය භූ දර්ශනයේ සුවිශේෂී ලක්ෂණයක් වන්නේ ........................................ වගාවයි.

(තිරිඟු / උක් / වී)

05 ශ්‍රී ලංකාව 1 : 50000 පරිමාණයේ සිතියම් කොටස් ........................................කින් සමන්විත වේ. (94 / 92 / 82)

- **ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ කියවා නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද දී ඇති වරහන් තුළ යොදන්න.**

06 සූර්යයාගේ මධ්‍යයේ උෂ්ණත්වය සෙල්සියස් අංශක මිලියන 150 පමණ වේ. (..........)

07 බුධ ග්‍රහයා පෘථිවියේ උපග්‍රහයෙකු වන චන්ද්‍රයාට වඩා තරමක් විශාලය. (..........)

08 ක්‍රි. ව. 1957 දී සෝවියට් දේශය විශ්වයේ තොරතුරු ගවේෂණය සඳහා කෘතිම චන්ද්‍රිකාවක් අභ්‍යවකාශගත කළේය. (..........)

09 පෘථිවිය දේශාංශ පදනම් කරගත් සම්මතවේලා කලාප 26 කට බෙදා ඇත. (..........)

10 කාන්තාර භූ දර්ශනයේ විශේෂ ලක්ෂණයක් වන්නේ අධික වාෂ්පීකරණයයි. (..........)

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝර යටින් ඉරක් අඳින්න.**

11 දකුණු ආසියා කලාපයේ පිහිටි කාන්තාර ප්‍රදේශයක් වන්නේ,

(1) සහරා කාන්තාරය (2) අරාබි කාන්තාරය (3) ථාර් කාන්තාරය (4) ගෝබි කාන්තාරය

12 මුම්බායි නගරය තුළ දැකිය හැකි ප්‍රබල ගැටළුවකි,

(1) අධ්‍යාපන හා සේවා පහසුකම් බහුල වීම. (2) වීදි ජනයා බහුල වීම.

(3) කර්මාන්ත වැඩිපුර ක්‍රියාත්මක වීම. (4) ඉඩම්වල මිල ඉහළයාම.

13 උපග්‍රහයන් පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ඝණ පාෂාණවලින් නිර්මාණය වී ඇත.

(2) නිශ්චිත හැඩයක් නොමැත.

(3) විවිධ ප්‍රමාණයේ අයිස් අංශුවලින් සැදී ඇත.

(4) ග්‍රහලෝක වටා පරිභ්‍රමණයවන කුඩා පරිවාර ග්‍රහලෝක වේ.

14 පෘථිවි වායුගෝලයේ වැඩිම ප්‍රතිශතයක් අන්තර්ගත වායුව වන්නේ මින් කුමක් ද?

(1) නයිට්‍රජන් (2) ඕසෝන් (3) ඔක්සිජන් (4) කාබන්ඩයොක්සයිඩ්

15 ග්‍රාමීය භූ දර්ශනයේ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ,

(1) දෛනික සංචලතාවය අධික වීම. (2) ජන ඝණත්වය අඩු වීම.

(3) සීමිත වූ භූමියක අධික ජන සංඛ්‍යාව. (4) කාර්මික කටයුතු බහුල වීම.

- **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න.**

16 ක්‍රි. ව. 1610 දී විශ්වය නිරීක්ෂණය සඳහා දුරදක්නය මුලින්ම භාවිතා කරන ලද්දේ ............................................ විසිනි.

17 ජලය ගොඩබිම සහ වායුගෝලය අතර චක්‍රීයව සංසරණයවීම ............................................................................ ලෙස හැඳින්වේ.

18 කොරල්පර හා අතොළුවලින් සැදි දූපත් 200 කට වැඩි සංඛ්‍යාවකින් ..................................................... රාජ්‍ය සමන්විත වේ.

19 අඟහරු ග්‍රහයාට ෆොබොන් සහ ......................................................... ලෙස නම් කර ඇති උපග්‍රහයන් දෙදෙනෙක් ඇත.

20 කාන්තාර ප්‍රදේශවල ජලය සහිත ප්‍රදේශ ............................................................... ලෙස හැඳින්වේ.

සැලකිය යුතුයි

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

01 (අ) පහත දැක්වෙන දකුණු ආසියාතික සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


(i) A අක්ෂරයෙන් දැක්වෙන කඳු වැටිය නම් කරන්න. (ලකුණු 01)

(ii) B අක්ෂරයෙන් දැක්වෙන දූපත් හැඳින්වෙන නම කුමක්ද? (ලකුණු 01)

(iii) C අක්ෂරයෙන් දැක්වෙන රටෙහි පිහිටි වගුරු බිම නම් කරන්න. (ලකුණු 01)

(iv) D අක්ෂරයෙන් දැක්වෙන ගංගාව නම් කරන්න. (ලකුණු 01)


(v) E අක්ෂරයෙන් දැක්වෙන මුහුද නම් කරන්න. (ලකුණු 01)





(vi) F අක්ෂරයෙන් දැක්වෙන සිනමා කර්මාන්තය ප්‍රසිද්ධ නගරය ලියන්න.(ලකුණු 01)

(vii) G අක්ෂරයෙන් දැක්වෙන අගනගරය සහ එය අයත් රට ලියන්න. (ලකුණු 02)


(ආ) 1 : 50000 භූ ලක්ෂණ සිතියම්වල දැක්වෙන ලක්ෂණ කිහිපයක් පහත සඳහන් වේ. ඒවා හැඳිනගෙන නම් කරන්න. (ලකුණු 03)




A




B



C

(ඉ) පහත දැක්වෙන්නේ ග්‍රහලෝකවලට අයත් තොරතුරු කිහිපයකි. එම තොරතුරට ආදාළ වන ග්‍රහලෝකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න. (ලකුණු 05)

(i) උපග්‍රහයන් වැඩිම ප්‍රමාණයක් සහිත ග්‍රහලෝකය (..............)


(ii) සෞරග්‍රහ මණ්ඩලයේ දෙවන විශාලම ග්‍රහලෝකය (..............)

(iii) අධික ශීතලක් සහිත ග්‍රහලෝකය (..............)

(iv) කුඩාම ග්‍රහලෝකය (..............)

(v) කාබන්ඩයොක්සයිඩ් වායුව අධිකම ග්‍රහලෝකය (..............)

02 පෘථිවිගෝලයේ ප්‍රධාන අක්ෂාංශ රෝබා දැක්වෙන සටහන පහත වේ.




(i) ඉහත රූප සටහනේ A, B, C, D, E යන අක්ෂර වලින් දක්වා ඇති ප්‍රධාන අක්ෂාංශ රේඛා නම් කරන්න. (ලකුණු 05)

(ii) පෘථිවි භ්‍රමණය නිසා ඇතිවන ප්‍රතිඵල දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(iii) ශ්‍රී ලංකාව අයත්වන වේලා කලාපය සඳහන් කරන්න. (ලකුණු 01)

(iv) ලෝකයේ ප්‍රාදේශීය වශයෙන් සම්මත වේලා කලාප කිහිපයක් භාවිතා වන රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03)

03 (i) වාමන ග්‍රහලෝක යනු මොනවාදැයි හඳුන්වන්න. (ලකුණු 03)

(ii) සෞරග්‍රහ මණ්ඩලයට අයත් වාමන ග්‍රහලෝක තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න. (ලකුණු 05)

(බුධ, බ්‍රහස්පති, සිකුරු, පෘථිවි, අඟහරු, නෙප්චූන්, සෙනසුරු)

a මතුපිට උෂ්ණත්වය අධිකතම ග්‍රහලෝකය

b අභ්‍යන්තර ග්‍රහලෝක අතර විශාලතම ග්‍රහලෝකය

c ගිණිකඳු පිපිරීමෙන් නිර්මාණය වූ ආවාට සහිත ග්‍රහලොව

d අධික ගුරුත්වාකර්ෂණ බලයක් සහිත ග්‍රහලෝකය

e පෘථිවිය මෙන් සිව් ගුණයක් විශාල ග්‍රහලෝකය.

04 (i) පෘථිවිය ජීවීන්ගේ වාසභූමියක් වීමට බලපා ඇති සාධක තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) වායුගෝලය දූෂණය වීමට බලපාන මානුෂ ක්‍රියාකාරකම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) පෘථිවිය පිළිබඳ පහත සඳහන් මූලික තොරතුරු නිවැරදිව යා කරන්න. (ලකුණු 05)

| (i) | (ii) |
|---|---|
| A කිලෝමීටර් මිලියන 150 | පරිභ්‍රමණ වේගය |
| B දින 365 පැය 6 යි | භ්‍රමණ වේගය |
| C තප්පරයට කිලෝමීටර් 11.2 | සූර්යයාගේ සිට දුර |
| D පැය 23 විනාඩි 56 | පරිභ්‍රමණ කාලය |
| E තත්පරයට කිලෝමීටර් 29.8 | භ්‍රමණ කාලය |

05 (i) පහත දැක්වෙන රටවල පිහිටි කඳුවැටි එක බැගින් නම් කරන්න. (ලකුණු 04)

ඉන්දියාව —

පාකිස්ථානය —

(ii) හිමාලය කඳුකරයේ වෙසෙන ගෝත්‍රික ජන වර්ග 4ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) කඳුකර පරිසරයට ආවේණික කඳුකර මිනිසුන්ගේ විශේෂ ශාරීරික හැඩගැසීම් තුනක් ලියන්න. (ලකුණු 03)


06. (i) වෙරළබඩ භූ දර්ශනයේ කැපී පෙනෙන භූ ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) වෙරළ තීරයේ පිහිටි විවිධ සංචාරක ආකර්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(iii) වෙරළතීරය විනාශවීමට බලපාන මානුෂ ක්‍රියාකාරකම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(iv) ධීවර කර්මාන්තය ආශ්‍රිත මානුෂ ක්‍රියාකාරකම් ඇසුරින් පහත සටහන සම්පූර්ණ කරන්න. (ලකුණු 05)

මාළු ටින් කිරීම →




07 (i) පහත දැක්වෙන භෞතික හා සංස්කෘතික ලක්ෂණ ඇසුරින් වගුව සම්පූර්ණ කරන්න. (ලකුණු 06)

(වනාන්තර, තැනිතලා, වැව්, වගාබිම්, ඇළ මාර්ග, ගංගා)

| සංස්කෘතික ලක්ෂණ | භෞතික ලක්ෂණ |
|---|---|
| | |

(ii) රූප සටහනේ AB සහ CD වලින් දැක්වෙන භූ ලක්ෂණ දෙක හැඳිනගෙන නම් කරන්න. (ලකුණු 02)




(iii) පහත සංස්කෘතික ලක්ෂණ සම්මත සංකේත හා වර්ණ භාවිතයෙන් ඇඳ දක්වන්න. (ලකුණු 03)

a ප්‍රධාන මාර්ගය

b දුම්රිය නැවතුම

c වැව

## පිළිතුරු පත්‍රය - I කොටස

01. තාරකාවකි 02. 71 % 03. කඩොලාන 04. වී 05. 92 06. ✗ 07. ✓
08. ✓ 09. ✗ 10. ✓ 11. ථාර් කාන්තාරය 12. වීදි ජනයා බහුල වීම
13. ග්‍රහලෝක වටා පරිභ්‍රමණයවන කුඩා පරිවාර ග්‍රහලෝක වේ. 14. නයිට්‍රජන්
15. ජන ඝනත්වය අඩුවීම. 16. ගැලීලියෝ ගැලීලි 17. ජල චක්‍රය 18. මාලදිවයින
19 ඩයිමෝස් 20. ක්ෂේමභූමි (2 x 20 = ල. 40)

## II කොටස

01 (අ) (i) හිමාලය (ii) අන්දමන් (iii) සුන්දරබාන් (iv) ගංගානම් ගඟ
(v) අරාබි මුහුද (vi) බොම්බාය (vii) ඉස්ලාමාබාද් පාකිස්ථානය (ලකුණු 08)
(ආ) A කොත්කන්ද B කපොල්ල C කඳු වැටිය (ලකුණු 03)
(ඉ) (i) බ්‍රහස්පති (ii) සෙනසුරු (iii) නෙප්චූන් (iv) බුධ (v) සිකුරු (ලකුණු 05)

02 (i) A - ආක්ටික් වෘත්තය B - කර්කටක නිවර්තනය C - සමකය D - මකර නිවර්තනය
E - ඇන්ටාර්ක්ටික් වෘත්තය (ලකුණු 05)
(ii) දිවා රාත්‍රී ඇතිවීම / වේලාවේ ප්‍රදේශීය වෙනස්කම් සිදුවීම (ලකුණු 02)
(iii) මදුරාසි වේලා කලාපය (ල. 01)
(iv) ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, ඕස්ට්‍රේලියාව, රුසියාව (ලකුණු 03)

03 (i) නිශ්චිත කක්ෂ තලයන් හඳුනාගත නොහැකි ප්‍රමාණයෙන් කුඩා ග්‍රහලෝක වේ. (ලකුණු 03)
(ii) ප්ලූටෝ, හෝමියා, මාකේ මාකේ, සෙරිස්, එරිස් (ලකුණු 03)
(iii) a - සිකුරු b - පෘථිවි c - බුධ D - බ්‍රහස්පති E - නෙප්චූන් (ලකුණු 05)

04 (i) ජලය පැවතීම / මධ්‍යස්ථ උෂ්ණත්වයක් පැවතීම / භ්‍රමණය හා පරිභ්‍රමණය සිදුවීම / ගුරුත්වාකර්ෂණ බලය පැවතීම / ජීවීන්ට හිතකර වායුගෝලයක් පැවතීම (ජලවාෂ්ප පැවතීම)
(ii) ඉන්ධන දහනය / වනාන්තර විනාශ කිරීම / කර්මාන්තශාලා වලින් දුම් පිට කිරීම (ලකුණු 03)
(iii) A සූර්යයාගේ සිට දුර B පරිභ්‍රමණ කාලය C භ්‍රමණ වේගය
D භ්‍රමණ කාලය E පරිභ්‍රමණ කාලය (ලකුණු 05)

05 (i) ඉන්දියාව - හිමාලය පාකිස්ථානය - හින්දුකුෂ්, සුලෙයිමාන් (ලකුණු 04)
(ii) ෂෙර්පා, භූටිය, කසා, ලෙප්චා දරඩ්. (ලකුණු 04)
(iii)
- ⋆ කඳු නැගීමට හැකිවන ලෙස ශක්තිමත්ව පිහිටි පැතලි පුළුල් පතුල් සහිත පාද
- ⋆ බර ඉසලීමට හැකිලෙස ශක්තිමත් වූ බාහු
- ⋆ අඩු ඔක්සිජන් වායුවෙන් ජීවත්වීමට හැකි අයුරින් සකස් වූ පෙනහළු (ල. 03)

06 (i) වැලිපර, කලපු, බොකු, තුඩු, කොරල්පර, කඩොලාන, (ලකුණු 02)
(ii) කොරල්පර සහිත නොගැඹුරු මුහුදු, ජෛව විවිධත්වය, සුදු වැලිතලා සහිත වෙරළ, සංචාරක හෝටල් පහසුකම්, හිරුඑළිය විඳගත හැකි ස්ථාන, රක්ෂිත කලපු හා හුදකලා දූපත් (කරුණු දෙකකට ලකුණු 02යි)
(iii) අනවසර ඉදිකිරීම් / හිරිගල් කැඩීම / වැලි ඉවත් කිරීම (කරුණු 02 කට ලකුණු යි)
(iv) A මාළු වෙරළඳාම B කරවල වේළීම C උම්බලකඩ සෑදීම D වෙනත් අතුරු නිෂ්පාදන
E සිප්පිකටු වෙනත් විසිතුරු භාණ්ඩ (ලකුණු 05)

07 (i) සංස්කෘතික ලක්ෂණ - වැව් / වගාබිම් / ඇළ මාර්ග
භෞතික ලක්ෂණ - වනාන්තර / තැනිතලා / ගංගා (ලකුණු 06)
(ii) AB - නිම්නය CD - නෙරුව(ලකුණු 02)
(iii) a - මැද රතුපාට දෙපස කළු පාටින් b - රතු රවුම් c - බැම්ම ගුරු පාටින්, වැව නිල් පාටින්